**ශීර්ෂය 306 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------

ශීර්ෂය 306 - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම, ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 20 දින දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම, ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**විසර්ජන ගිණුම**

------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 58,051.69 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 44,485.03 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 13,566.66 ක් හෙවත් සියයට 23.37 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

| **ශීර්ෂය** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 14,165.49 | 14,048.78 | 116.71 | 0.82 |
| මූලධන | 43,886.20 | 30,436.25 | 13,449.95 | 30.65 |
| **එකතුව** | **58,051.69** | **44,485.03** | **13,566.66** | **23.37** |

**2.1** **ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා අංක 20.01.01.00 දරන ආදායම් සංකේතය සඳහා එකතුව රු. මිලියන 6,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 6,334 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 334 කින් හෙවත් සියයට 5.57 කින් ඉක්මවා ආදායම් රැස්කර තිබුණි.

**2.2** **අත්තිකාරම් ගිණුම**

**2.2.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු. මිලියන |
| 545.00 | 488.58 | 400.00 | 420.75 | 1,500.00 | 851.06 |

**2.3** **අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 8003 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 649.5 ක් විය.

**2.4** **ගබඩා අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30602 යටතේ ගබඩා අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සිමාව | තථ්‍ය | උපරිම සිමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2,000.00 | 1,957.55 | 1,800.00 | 1,490.88 | 6,935.00 | 6,780.03 |

## 2.5 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 321.9 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් වර්ගය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| විවිධ තැන්පතු | 202.2 |
| ටෙන්ඩර් තැන්පතු | 119.7 |
| **එකතුව** | **321.9** |

## 2.6 විගණන නිරීක්ෂණය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම, ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ගිණුම් ඉදිරිපත් කිරීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ 2016 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කල යුතු වුවත්, එම ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ 2016 මැයි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය / විෂය අංකය | ගිණුමේ නම | 2016 මැයි 31 දින වන විට ප්‍රමාදය |
|---|---|---|
| 306 | විසර්ජන ගිණුම | දින 60 |
| 30601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය | දින 31 |

## 3.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | | අදාළ රෙගුලාසි |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

## 3.3 විගණන සාක්ෂි නොවීම

අනන්‍යතාවය තහවුරු කිරීමේ සාක්ෂි, රාජකාරි විස්තර, භාණ්ඩ නිකුත් කිරීමේ නියෝග, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා ලේඛන ආදී වූ අවශ්‍ය සාක්ෂි දෙපාර්තමේන්තුවෙහි නොතිබීම නිසා එකතුව රු.මිලියන 31,100.80 ක මුදලකට අදාළ වූ ගනුදෙනු 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 3.4 පොදු තැන්පත් ගිණුම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යන ගිණුම් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය දැනුවත් කිරීම හා අඛණ්ඩ ගිණුම්කරණ සම්බන්ධයක් පවත්වා ගෙන යාම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වුවත්, ඊට පටහැනිව රු.මිලියන 321.95 ක් වූ පොදු තැන්පත් ශේෂ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයට වාර්තා කිරීම හෝ වාර්ෂික විසර්ජන ගිණුමෙන් හෙළිදරව් කර හෝ නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 565(3) ප්‍රකාරව පොදු තැන්පත් ගිණුම මාසිකව ශේෂ කර සසදා නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 565(5) ප්‍රකාර මාසික තැන්පත් සාරාංශ ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 ආදායම් ගිණුම්

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් අංක 20.01.01.00 දරන ආදායම් සංකේතයට අදාළව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරයන් පැවැරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කරන ලද නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු.මිලියන 1,430.29 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 01 ක සිට වර්ෂ 15 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ආදායම් අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතිණි.

(ආ) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් සංකේතයකට අදාළ අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

(ඇ) ආදායම් සංකේතයකට අදාළව රැස්කර තිබුණු එකතුව රු.මිලියන 61.61 ක් වූ ආදායමින් දෙපාර්තමේන්තුවට අයත් ආදායම හඳුනාගෙන අදාළ ආදායම් සංකේතවලට බැර කිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ වර්ෂ 1 ක සිට වර්ෂ 2 ක් දක්වා වූ කාල පරාසයක සිට රඳවාගෙන තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් මාසයේ ආදායම් ගිණුම්ගත කිරීමේදී රු.මිලියන 144.00 ක ආදායම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 30601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 92,876,772 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 කට වැඩි කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, ඒවා අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ශේෂ දැක්වෙන කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ පිළියෙල කළ යුතු වුවත්, අනුරාධපුර ප්‍රවාහන අධිකාරී කාර්යාලයට අයත් රු.4,153,547 ක ණය ශේෂ සඳහා කිසිදු ශේෂ ලැයිස්තුවක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව හර ශේෂය රු.මිලියන 846.88 ක් වූ අතර භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව ශේෂය රු.මිලියන 851.06 ක් වී තිබුණි. ඒ අනුව 2004 වර්ෂයේ සිට පැවත එන රු.මිලියන 4.18 ක් වූ ශේෂ අතර වෙනස 2016 මාර්තු 31 දින වන විටත් වර්ෂ 11 ක් ගත වී තිබුණත්, එම වෙනස සසඳා නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඈ) සෑම මාසයක් අවසානයේදීම පාලන ගිණුම් ශේෂ හා CC10 ලේඛන සමග සැසඳිය යුතු වුවත්, 2015 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තුවේ පාලන ගිණුමේ ශේෂය අතර රු.මිලියන 13.29 ක වෙනසක් පැවැතුණි.

## 3.7 ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම්

අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව අත්තිකාරම් ගිණුම් කාර්යයන් 05 ක ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණු අතර එම ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු 1987 දින වන විට අවසන් කල යුතුව තිබුණි. එහෙත් 2015 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 28 ක කාලයක් ගත වී තිබුණත්, එම කටයුතු නිම කර නොතිබුණි. ගනුදෙනු බේරා වසා දැමීමේ කටයුතු කරගෙන යාම සඳහා අත්තිකාරම් ගිණුම් 05 කට අදාළ අනුමත නොකළ සමුච්චිත කාරක පාඩුවල එකතුව රු. මිලියන 3.4 ක් වී තිබුණි.

## 3.8 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-------------------------------------

### 3.8.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර භාණ්ඩ හා සේවා ලබා ගැනීමට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.මිලියන 38,320.06 ක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.මිලියන 5,565.06 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සඳහා 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.8.2 විගණන හා කළමනාකරණ කමිටුව

-------------------------------------

2009 ජූනි 29 දිනැති අංක DMA/2009/01 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් පැවැතිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී කමිටුවේ රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 3.9 වත්කම් කළමනාකරණය

--------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් අක්කර 12,000 ක් පමණ බදු දීමක් හෝ වෙනත් කාර්යයක් සඳහා උපයෝජනය නොකර වර්ෂ 150 ක් පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතිණි.

(ii) ණයවර ලිපි වටිනාකම රු. 5,086,986 ක් වූ විද්‍යුත් පාලන 1,000 ක් 2011 වර්ෂයේ දී ඇණවුම් කර එම භාණ්ඩ ගබඩාවට ලැබී තිබුණි. අපේක්ෂිත පිරිවිතරයන්ට නොගැලපීමක් මත ඒ පිළිබදව අදාළ සමාගම දැනුවත් කර තිබුණි. 2015 ජූනි 07 දින එම සමාගම දෙපාර්තමේන්තුවට පැමිණ අදාළ කටයුත්ත සපුරාලීමට අවස්ථාවක් ඉල්ලුම් කර තිබුණ ද, 2016 මැයි 31 දින වන විටත් ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිචාරයක් දක්වා නොතිබුණි. මේ නිසා රු.5,086,986 ක තොග නිෂ්ක්‍රියව වර්ෂ 05 ක පමණ කාලයක් ගබඩාවේ රදවා ගෙන තිබුණි.

(iii) 1995 වර්ෂයේදී රු.මිලියන 33 කට ආසන්න මුදලක් වැය කරමින් මිලදී ගෙන තිබූ කන්ටේනර් ෆෝල්ක් ලිෆ්ට් ඔසවනය වසර 20 කට වඩා වැඩි කාලයක සිට භාවිතයෙන් තොරව කොළඹ දුම්රිය අංගනයේ නිෂ්ක්‍රීයව පැවතුණි.

(iv) දෙපාර්තමේන්තුව සතු දුම්රිය එන්ජින් 21 ක්, දුම්රිය මැදිරි 04 ක්, බොගි ගැල් 22 ක්, රෝද 4 ගැල් 02 ක්, මෝටර් වාහනයක් හා යන්ත්‍ර ඒකක 22 ක් නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත තත්ත්වයක පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2016 ජූනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2016 ජූලි 18 දින වන විටත් උප දෙපාර්තමේන්තු 03 ක් යටතේ වූ ශාඛා කාර්යාල 21 කට අදාළ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2015 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා කරන ලද වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

වෙනත් ආයතන සතුව තිබුණු මෝටර් රථ 04 ක් විධිමත් පවරා ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.මිලියන 340.39 ක් වූ අතර, ඒවා වර්ෂයකට අඩු කාලයක සිට පැවත එමින් පැවැතුණි.

**3.10 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය | 74,548,474 | දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් රත්මලානේ පිහිටි රජයේ නිවාස 696 ක පදිංචි වී සිටින නිලධාරීන්ගෙන් ජල බිල්පත් අයකර ගෙන නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

---

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 115(3)(ආ) | 12,839,333 | අවස්ථා තුනකදී ඉකුත් වර්ෂවලදී ලබා ගෙන තිබුණු අමතර කොටස් සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණත් ඒ සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 128 (1) (එ) | 13,074,314 | 2015 වර්ෂයේදී අවස්ථා 39 කදී ඉන්වොයිස් 186 ක් සඳහා දින 21 ක සිට දින 963 ක් දක්වා කාල පරාසයක් තුළදී භාණ්ඩ මුදා ගැනීම ප්‍රමාද කිරීම නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරියට ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි. |

**(ඇ) දුම්රිය දෙපාර්තමේන්තුවේ පොදු උපදෙස් සංග්‍රහය**

---

| | | |
|---|---|---|
| (i) xi වන පරිච්ඡේදයේ 1.1 වගන්තිය | 18,579,511 | දුම්රිය ස්ථාන දෛනික ආදායම නියමිත දිනයේ දී දුම්රිය ගණකාධිකාරී කාර්යාලය වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ii) xi වන පරිච්ඡේදයේ 2.17 වගන්තිය | - | දුම්රිය ස්ථාන වෙත දෛනිකව ලැබෙන ආදායම් දුම්රිය ප්‍රධාන ගණකාධිකාරී වෙත ප්‍රේෂණය කර එම ආදායම් දෛනිකව සැසඳීම් කර නිවැරදි බවට සනාථ කර ගත යුතු වේ. එසේ වුවත්, සමාලෝචිත වර්ෂයේදී මාස 01 ක සිට මාස 12 ක් දක්වා වූ කාල පරාසයක දුම්රිය ස්ථාන 337 ක මගී ආදායමද, දුම්රිය ස්ථාන 263 ක වාර ප්‍රවේශපත්‍ර ආදායමද දුම්රිය ස්ථාන 303 ක පාර්සල් ප්‍රවාහන ආදායම ද, සැසඳීම් නිමකර නොතිබුණි. |
| **(iii)** 1998 නොවැම්බර් 05 දිනැති අංක බටා/හදිසි අත්තිකාරම් ගෙවීම් 98 දරන දුම්රිය සාමාන්‍යාධිකාරිගේ චක්‍රලේඛයේ 02 ix ඡේදය | 7,345 ,502 | ලබාගත් අත්තිකාරම් සතියක් ඇතුළත ඉදිරිපත් කර එම අත්තිකාරම් පියවිය යුතු වුවත්, 2015 නොවැම්බර් 27 දින වන විට දුම්රිය ස්ථාන දෛනික ආදායමෙන් ලබාගත් අත්තිකාරම් වර්ෂ ගණනාවක් මුළුල්ලේ පියවා නොතිබුණි. |

**3.11 විදේශාධාර ව්‍යාපෘති**

-----------------------

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් විදේශීය මූල්‍යනය යටතේ ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති ගිවිසුම් අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැයවල එකතුව ඇ.ඩො.මිලියන 692.27 ක් වී තිබුණි. එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 16,978.43 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**

-----------------------------------------

විදේශාධාර ව්‍යාපෘතිවල මූල්‍ය කාර්යසාධනය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.

**(i) සංඥා හා විදුලි සංදේශ ව්‍යාපෘතිය**

----------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- **වගකීම් කාල සීමාව තුළ දුම්රිය ස්ථාන පවරා නොගැනීම**

  ----------------------------------------------------------

  සංඥා පද්ධති සවිකර තිබූ දුම්රිය ස්ථාන 26 කින් පිරිවැය රු. මිලියන 4,567 ක් වූ දුම්රිය ස්ථාන 10 ක වර්ෂ 03 ක වගකීම් කාල සීමාව 2016 සැප්තැම්බර් 20 වන විට ඉක්මවා තිබුණි. විශේෂිත කොන්ත්‍රාත් කොන්දේසි (Particular Condition of Contract) වගන්ති 21 ට අනුව ඒවා ව්‍යාපෘති ඒකකය වෙත භාරගෙන නොතිබුණි. එම නිසා එම දුම්රිය ස්ථානවල උපකරණවල දෝෂයන් ඇති වුවහොත් කොන්ත්‍රාත්කරුගේ වගකීමක් නොමැති බැවින් දෙපාර්තමේන්තුවට අතිරේක පිරිවැයක් දැරීමට සිදු විය හැකිව තිබුණි.

- **දුම්රිය ස්ථාන සඳහා සංඥා උපාංග සවිකිරීම.**

  ---------------------------------------------

  කොන්ත්‍රාත් ගිවිසුමේ පරිච්ඡේද vii නිර්මාණ (Design) කරන අවස්ථාවේ සංඥා පද්ධති සවිකර තිබූ දුම්රිය ස්ථාන 26 ක, විශාල දුම්රිය ස්ථාන හා කුඩා දුම්රිය ස්ථාන වශයෙන් පැහැදිලිව හඳුනා නොගැනීමේ අඩුපාඩු නිසා කොන්ත්‍රාත්කරුට ඇ.ඩො. 469,462 ක් හෙවත් රු.මිලියන 62 කට ආසන්න මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. එම වැඩිපුර ගෙවා තිබුණ මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට 2016 සැප්තැම්බර් මාසය වන විටත්, අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

- **ඒකක පිරිවැය ගණනය කිරීම පිළිබද සාක්ෂි**

  ---------------------------------------------

  ව්‍යාපෘතිය යටතේ විශාල හා කුඩා දුම්රිය ස්ථානයන් සඳහා සවි කර තිබූ සංඥා උපාංගවල පිරිවැය අතර රු.මිලියන 62 ක වෙනසක් නිරූපනය විය. එම අසාමාන්‍ය ඒකක පිරිවැය වැඩි වීමට හේතු විගණනය වෙත පැහැදිලි ලෙස ඉදිරිපත් කර නොතිබුණි .

- **මිලදි ගත් සංඥා උපකරණවල ගුණාත්මකභාවය අඩු වීම**

  ---------------------------------------------------------------

  කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි 4.9 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් භාවිතා කරන ලද උපකරණවල ගුණත්ත්වය පිළිබද සහතිකයක් ව්‍යාපෘතිය වෙත ලබා දිය යුතු වුවද, කොන්ත්‍රාත්කරු විසින් මිලදි ගන්නා ලද  ඇ.ඩො. 2,082,360 ක් එනම් ආසන්න වශයෙන් රු.මිලියන 274 ක් වටිනා Location Boxes 740 ක් සහ ඇ.ඩො. 1,486,296 ක් එනම් රු.මිලියන 196 ක් වටිනා Point Machine 189 ක්  ව්‍යාපෘතිය අවසන් වී වර්ෂයක කාලසීමාවක් තුළ මල බැදීම්වලට ලක් වෙමින් නිෂ්ක්‍රීයව පැවැතුණි.

- **අවශ්‍යතාවය  නිසි පරිදි හඳුනාගැනීමකින්  තොරව මිලදි ගැනීම**

  ------------------------------------------------------------------

  දුම්රිය ස්ථානාධිපති කාමරවල ස්ථාපිත කර තිබූ සංඥා පද්ධතිය පාලනය කිරීමේ උපකරණයක් සවිකර තිබියදීත් කොන්ත්‍රාත්කරු විසින් Block Instrument 56 ක් දුම්රිය ස්ථාන 26 ක් වෙනුවෙන්  ඇ.ඩො. 628,888 එනම් රු. මිලියන 83.01 ක පිරිවැයකට සවි කර තිබුණි. මෙම උපකරණ අවශ්‍යතාවයට නුසුදුසු බැවින් ඒ සඳහා  වැය කළ මුදල අනාර්ථික වී තිබුණි.

- **වාහන පාලනය**

  ----------------

  කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතියේ මාර්ග පරීක්ෂාවන් සඳහා ජීප් රථ 06 ක් මිලදි ගෙන තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි 9.1 අනුව කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය අවසානයේ ව්‍යාපෘති කාර්යාලය වෙත එම වාහන භාරදිය යුතුය. මිලදී ගත් වාහන 06 කින් 05 ක් ව්‍යාපෘති කාර්යාලය වෙත කොන්ත්‍රාත්කරු විසින් භාර දී තිබුණු අතර අන්තර් ගෙවීම් සහතික පත්‍ර අංක 20 යටතේ ඉතිරි වාහන සඳහා ඇ.ඩො. 20,800 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කළද, එම වාහනය ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට විධිමත්ව භාර දී නොතිබුණි. එමෙන්ම මුළු පිරිවැය  ඇ.ඩො. 156,000 ක් වටිනා වාහන 06 ක විධිමත්ව අදාළ නිලධාරින්ට පවරා දීම පිළිබද සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ii)** **මඩු තලෙයිමන්නාරම් දුම්රිය මාර්ග ව්‍යාපෘතිය**

------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

- **කොන්ක්‍රීට් සිල්පර පළුදුවීම**

  ----------------------------

  මඩු තලෙයිමන්නාරම් දුම්රිය මාර්ග ව්‍යාපෘතිය පිළිබඳ 2016 අගෝස්තු 24 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

  – දුම්රිය මාර්ගයට යොදා තිබූ කොන්ක්‍රීට් සිල්පර පළුදුවීම්වලට ලක්වී තිබූ අතර කොන්ත්‍රාත් සමාගම එම පළුදු වූ සිල්පර ඉවත් කරමින් නව සිල්පර යෙදීම ආරම්භ කර තිබුණි.

  – කොන්ක්‍රීට් සිල්පර දුම්රිය මාර්ගයට යෙදීමට පෙර ගුණාත්මකභාවය පිළිබඳව පරීක්ෂා කළ යුතු වුවත්, එසේ පරීක්ෂා කළ බව තහවුරු කරන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර  නොතිබුණි.

- **පාලම් නැවත ඉදිකිරීම**

  -----------------------

  මඩු තලෙයිමන්නාරම් දක්වා වූ දුම්රිය මාර්ගයේ ඉදිකර තිබූ පාලම් 03 ක් දෝෂ සහිත තත්ත්වයේ පවතින බැවින් එම පාලම් ඉවත් කර නව පාලම් ඉදිකිරීමට කොන්ත්‍රාත් සමාගම එකඟ වී තිබුණි. 2016 සැප්තැම්බර් 30 දින වන විටත් ඒවායේ කටයුතු ආරම්භ කර නොතිබුණු අතර ව්‍යාපෘතියෙහි ගිවිසුම්ගත කාලය හා දෝෂ නිවැරදි කිරීමේ කාලය 2016 දෙසැම්බර් 13 දින අවසන්වීමට නියමිතව තිබුණි. මෙම කාලය තුළ ඉහත කාර්ය නිම කර ගැනීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ යුතු අතර, එසේ සිදු නොවීම නිසා ව්‍යාපෘතියට අතිරේක වැය බරක් දැරීමේ අවධානමක් පැවතුණි.

**3.12 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) වැඩ ආරම්භ කිරීම ප්‍රමාද වූ ව්‍යාපෘති**

------------------------------------

ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 50 ක් වූ භූගත ලියවන පට්ටලය සවි කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනට ඉතිරි වැඩ වටිනාකම රු.මිලියන 47 ක් වී තිබුණි. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 දෙසැම්බර් 31 දින දුම්රිය දෙපාර්තුමේන්තුව හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යන දෙපාර්ශවය අතර රු.මිලියන 31.45 ක් වටිනාකමකට එකඟතා ගිවිසුමකට එළඹ තිබුණි. 2016 ඔක්තෝබර් 27 දින වන විටත් එම ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

-----------------------------------------------------------------

දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් අංශයේ ලිපිගොනු පරිගණකගත කිරීමේ හා එම තොරතුරු පද්ධතිය කළමනාකරණ කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 2 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර රු.මිලියන 1.39 ක් වැය කර තිබුණි. 2016 ඔක්තෝබර් 27 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 01 මාස 10 ක් ගත වී තිබුණද, එම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත කාර්යසාධන මට්ටම ලගා කර ගැනීමට නොහැකි වී තිබුණි.

**3.13 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

---------------------------------------------------------

බැංකු ගිණුමකට අදාළව 2015 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ 2016 ජනවාරි 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**(ආ) අක්‍රීය බැංකු ගිණුම්**

---------------------

දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලැබූ ඉතිරි කිරීමේ ගිණුමක් වර්ෂ 12 මාස 2 ක කාලයකට සිට 2015 දෙසැම්බර් 31 දින වන විටත් අක්‍රීය වී තිබුණු අතර, 2015 දෙසැම්බර් 31 දිනය එහි ශේෂය රු.1,991,312 ක් වි තිබුණි.

(ඈ) **ගැලපුම් කළ යුතු ශේෂ**

දුම්රිය දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලැපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | එකතුව |
|---|---|---|---|---|
| | | මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු | වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 ට අඩු | |
| | | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | 528,140 | - | 528,140 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 2,560,311 | 1,802,947 | 4,363,258 |
| (iv) | හඳුනා නොගත් බැර | - | 134,400 | 134,400 |
| (v) | ප්‍රමාණවත් පියවර නොගත් අගරු චෙක්පත් | 1,817,257 | - | 1,817,257 |
| (vi) | වෙනත් ගැලපීම් | 97,990 | 210,260 | 308,250 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බැංකු ගිණුම් දෙකකට අදාළව නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ මාස 6 ක් ඉක්ම වූ එකතුව රු.2,059,268 ක් වටිනා චෙක්පත් 94 ක් හා එකතුව රු.2,303,990 ක් වටිනා චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 395 (ඉ) ප්‍රකාරව බැංකුවේ තැන්පත් කරන ලද නමුත් උපලබ්දි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් විස්තර ඉදිරිපත් කළ යුතු වුවත්, බැංකු ගිණුමකට අදාළ රු.46,517,321 ක් වටිනා උපලබ්දි නොවූ තැන්පත් සම්බන්ධයෙන් එවැනි උපලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි.

(iii) බැංකු ගිණුමකට අදාළව පිළියෙල කරන ලද බැංකු සැසඳුම ප්‍රකාශය ප්‍රකාරව අගරුවූ චෙක්පත් වටිනාකම රු.1,817,257 ක් වී තිබුණත්, ඒ සම්බන්ධයෙන් උපලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි.

(iv) 2015 දෙසැම්බර් මාසය දක්වා අවස්ථා 07 කට අදාළව හඳුනාගන්නා ලද බැංකු ගිණුමකට රු.540,319 ක්වූ වැරදි නිවැරදි කර මුදල් පොත සංශෝධනය කිරීමට දෙපාර්තමේන්තුව විසින් ක්‍රියා කර නොතිබුණි.

(v) බැංකු ගිණුමකට අදාළව 2013 වර්ෂයේ ජනවාරි මාසය සඳහා වූ බැංකු සැසඳුම් ප්‍රකාශය මගින් හඳුනාගන්නා ලද රු.144,101 ක් වටිනා බැංකු ගිණුමේ වැරදි, 2015 දෙසැම්බර් මාසය වන විටත් නිවැරදි කර නොතිබුණි.

**3.14 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------------

2015 වර්ෂයේදී දිනක ගාස්තුව රු. 1,360 ක් හා එකතු කළ අගය මත බදු සමඟ ගාස්තුව රු.163.20 බැගින් කම්කරුවන් 20 දෙනෙකු සඳහා රු.1,220,083 ක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි. එම ආයතනය ඉදිකිරීම් සමාගමක් වන අතර ශ්‍රම සපයන ආයතනයක් නොවන බැවින් සේවකයන්ගේ සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබද සොයා බැලීමකින් තොරව බඳවා ගැනීම් සිදුකර තිබීම මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනුක් විය.

**3.15 අවිධිමත් ගනුදෙනු**

--------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

---------------------------------------------------------------------------

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 4.1 ඡේදය යටතේ පහත සඳහන් වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදන වැය කළ යුතු වන්නේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව බව පැහැදිලිව සඳහන් කර තිබුණත්, ඊට පටහැනිව සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(අ) මාර්ගෝපදේශය පටහැනිව සීමිත සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා 2015 පෙබරවාරි මාසයේදී රු. 50,510,080 ක් වටිනා මිලදී ගැනීම් සිදු කර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:3 මාර්ගෝපදේශය පටහැනිව ගබඩා අධිකාරි කාර්යාලය විසින් 2015 වර්ෂයේදී මිලදී ගෙන තිබු රු.88,690,000 ක් හා රු.3,909,628 ක් වටිනා මිලදී ගැනීම් සඳහා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.මිලියන 2 ට අඩු භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේ දී මුද්‍රා තබන ලද ලංසු 05 ක් අතුරින් ලංසු ඇගැයීම් කර කොන්ත්‍රාත්කරු තෝරා ගත යුතුව තිබුණි. සැපයුම්කරුවන් 18 දෙනෙකු වෙත ලංසු ඉදිරිපත් කරන ලෙස දන්වා යවා තිබුණත්, ඉන් දෙදෙනෙකුගේ ලංසු පමණක් ඇගයීම් කර එම දෙදෙනා විසින් ඉදිරිපත් කර තිබුණු මිල ගණන් පිරිවිතරවලට නොගැලපෙන බව ප්‍රකාශ කර එම ලංසු ප්‍රතික්ෂේප කර තිබුණි. වැඩි මිල ගණන වූ රු.1,979,968 ක ලංසුව ඉදිරිපත් කර තිබුණු ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(iv) 2015 පෙබරවාරි මාසයේදී රු.50,510,080 ක්ද, රු.51,219,776 ක්ද, රු.10,132,096 ක් හා රු.83,574,934 ක්ද ගෙවා අමතර කොටස් 600 ක් මිලදී ගෙන තිබුණි. මෙම තොග අයිතමයේ උපරිම තොග ඒකක ගණන 300 ක් වුවද, 2014 අගෝස්තු මාසයේදී ඒකක 600 ක් මිලදී ගෙන තිබුණි. මිලදි ගත් දින සිට වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද, ඒකක 160 ක් පමණක් නිකුත් කර භාවිතයට ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම අනුව කටයුතු නොකර දෙපාර්තමේන්තුවේ අරමුදල් නිෂ්කාර්යව තොගවල යොදවා තිබුණි.

(v) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11(අ) මාර්ගෝපදේශයට පටහැනිව ලංසු සුරක්ෂණ ලබා නොගෙන අවස්ථා 05 ක දී එකතුව රු.7,173,712 ක් වටිනා ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි.

(vi) සමාලෝචිත වර්ෂයේදී රු.338,392 ක මිලදි ගැනීම වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාර කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි.

(vii) ලංසු ඉදිරිපත් කර තිබූ සැපයුම්කරුවන් 04 දෙනෙකු අතරින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාව අනුව තෙවන අඩු මිල වූ රු.196,000 ක ලංසුව ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් මිලදී ගැනීම නිර්දේශ කර තිබුණි. අඩුම මිල ගණන් ඇතුළත් ලංසුකරුගේ දේශිය නියෝජිත ආයතනය විසින් ලබා ගන්නා සියයට 2 ක කොමිස් ඇතුළුව ඉදිරිපත් කර තිබූ රු.147,544 ක් වූ අවම මිල ඇතුළත් ලංසුව ප්‍රතික්ෂේප කර, තෙවන මිල ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් ඒකක 30 ක් මිලදී ගැනිම නිසා රු.1,453,680 ක් වැඩිපුර වැය කර තිබුණි.

(viii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.6 මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ක්‍රමවේදයකට ආකෘති පත් භාවිතා නොකර 2015 පෙබරවාරි මාසයේදී අවස්ථා 06 කදී එකතුව රු.50,510,088 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

(ix) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.4.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ඇගයීම හැකිතාක් ඉක්මනින් සිදු කළ යුතු වුවද, අමතර කොටස් මිලදී ගැනීමේ තාක්ෂණික ඇගයීම මාස 01 ක සිට මාස 05 ක් දක්වා කාල පමාවක් හා ප්‍රසම්පාදන කමිටු නිර්දේශයේ ප්‍රමාදය මත ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ලංසුවල වලංගු කාලය අවස්ථා කීපයකදී දීර්ඝ කිරීමට සිදු වී තිබුණි. ඒ අනුව රු.මිලියන 12.47 ක් වටිනා අමතර උපාංග රත්මලාන ගබඩාව වෙත ලැබීමට භාණ්ඩ ඇණවුම් කළ දින සිට වර්ෂ 01 මාස 05 ක සිට වර්ෂ 02 මාස 05 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදු කර තිබුණි.

(x) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2 මාර්ගෝපදේශය ප්‍රකාරව එක් සැපයුම්කරුවෙකු පමණක් ලංසු ඉදිරිපත් කර තිබූ විට එම ලංසුව වෙළඳපොල මිල අනුව සාධාරණ මිල ගණන් ඉදිරිපත් කර ඇති බවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කිරීමකින් තොරව රු.5,908,708 ක් වටිනා අමතර උපාංග මිලදී ගෙන තිබුණි.

**3.16 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

**---------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අයථා ලෙස පිළියෙල කළ වෛද්‍ය සහතික ඉදිරිපත් කර නිවාඩු දින 6,065 ක් ලබාගෙන නියමිත සේවයේ නොයෙදමින් දුම්රිය නියාමකයින් වංචනිකව රු.මිලියන 4.02 ක අතිකාල ලබා ගෙන තිබුණි. එම නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ I පරිශිෂ්ටයේ (2) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූලව සේවයට පැමිණීම සටහන් කිරීම සඳහා රු. මිලියන 13ක් වැයකර දෙපාර්තමේන්තුව විසින් ඇඟිලි සලකුණු යන්ත්‍ර 71 ක් මිලදී ගෙන සවිකර තිබුණි. එම යන්ත්‍රවල ඇඟිලි සලකුණු කිරීම දුම්රිය ස්ථානාධිපති සේවය, දුම්රිය රියදුරු හා දුම්රිය නියාමක සේවය ආදී විවිධ තනතුරු දරන නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. කාර්ය මණ්ඩලය විසින් අදාළ අතිකාල පැය ගණන, නිවාඩු දින වැටුප් ගෙවීම් දත්තවල නිවැරදිභාවය තහවුරු කර ගැනිමට නොහැකි වී තිබුණි.

## 3.17 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති අබලි යකඩ මෙට්‍රික් ටොන් 4,454.78 ක් ද, මාර්ග හා කර්මාන්ත උප දෙපාර්තමේන්තුවේ භාවිතයට නුසුදුසු රේල්පීලි මෙ.ටො. 2,552.58 ක්ද අගය කර වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) යල් පැන ගිය හා භාවිතයෙන් ඉවත් කළ ද්‍රව්‍යවලින් උද්ගත වූ පාඩු වශයෙන් රු.13,829,758 ක ශේෂයක් වර්ෂ ගණනාවක් මුළුල්ලේ ගිණුම්වල ඉදිරියට ගෙනවිත් තිබුණි. එම ශේෂය කපා හැරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ලිපිගොනු ප්‍රකාරව ඉන්ඩෙන්ටු අංක 04 ක් යටතේ මෙරටට ආනයනය කරන ලද රු. 13,554,271 ක භාණ්ඩ 2016 මැයි 31 දින වන විටත් වරායෙන් මුදා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම භාණ්ඩ අහිමිවීමට හෝ අනාර්ථිකව වරාය ගාස්තු ගෙවීමට සිදුවීමේ අවධානමක් පැවතුණි.

(ඈ) අමතර කොටස් මිලදී ගැනීමකදී මිල ගණන් කැඳවීමේ ලිපියේ කොන්දේසි අංක 11 ට අනුව සැපයුම්කරුවන් විසින් ඇණවුම් භාර දුන් දිනයේ සිට භාණ්ඩ සැපයිය යුතු කාල සීමාව සඳහන් කර තිබුණද එම කාල සීමාව තුළදී අමතර කොටස් සපයා නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. ඒ සඳහා රු.290,157 ක ප්‍රමාද ගාස්තු අදාළ සැපයුම්කරුගෙන් අයකර ගෙන නොතිබුණි.

(ඉ) දුම්රිය ජාලය තුළ වෙළඳ දැන්වීම් ප්‍රචාරණය පිළිබඳ පූර්ණ අයිතිය බාහිර පාර්ශවයකට බදු දී තිබුණි. 2011 සැප්තැම්බර් 07 දින එම ආයතනය සමඟ දෙපාර්තමේන්තුව ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම ප්‍රකාරව අදාළ ආයතනය කටයුතු නොකිරීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුවට රු.මිලියන 425 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඊ) දෙපාර්තමේන්තුව තුළ සිදු වී තිබුණු එකතුව රු.මිලියන 293.67 ක පාඩු හා අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.18 අනාර්ථික ගනුදෙනු

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු. මිලියන 9.33 ක් වටිනා අමතර කොටස්, ලිහිසි තෙල් යනාදී භාණ්ඩ ඒකක 3,816 ක් විගණන දිනය වූ 2016 ජනවාරි 05 දින වන විටත් නිකුත් කිරීමකින් තොරව ගබඩාවේ නිෂ්කාර්යව පැවැතුණි.

(ආ) රෝලර් බෙයාරින් 60 ක් මිලදී ගැනීම සඳහා ජාතික/ ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීම් යටතේ ලංසු 05 ක් ලැබී තිබුණි. එම ලංසු අතුරින් අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනය වෙතින් එකක් රු. 8,662 බැගින් රු. 519,720 කට මිලදී ගැනීමට හැකියාව තිබියදී වෙනත් සමාගමකින් එකක් රු. 65,160 බැගින් බෙයාරින් 60 ක් මිලදී ගැනීම නිසා රු.3,389,880 ක් එම ආයතනයට වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) මිල ගණන් ඉදිරිපත් කරන්නන් හට ලබාදී ඇති ප්‍රසම්පාදන දැන්වීමේ උපදෙස් මාලාවේ 6 (b) ඡේදය ප්‍රකාරව සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු තොරතුරු අඩුම මිල ගණන් ඉදිරිපත් කළ ලංසුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. එහෙත් එම

සැපයුම්කරුවන්ගෙන් ඒ පිළිබඳව විමසා බලන ලද සාක්ෂි ලිපිගොනු පරීක්ෂා කිරීමේදී එවැනි තොරතුරු ඉදිරිපත් නොකළ බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා සැපයුම්කරුගෙන් අවම මිලට මිලදී ගැනීමට තිබුණු අවස්ථාව අහිමි වීම නිසා රජයට රු. 2,360,137 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී රු.මිලියන 4,483 ක් වටිනා ස්ථිර මාර්ග උපකරණ කට්ටලයක් මිලදී ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම උපකරණ කට්ටලය නිකුත් නොකර තිබුණි. එසේ තිබියදීත් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 50 ක් වටිනා ස්ථිර මාර්ග උපකරණ තොග මිලදී ගෙන තිබුණි.

(ඉ) දිස්ත්‍රික් ඉංජිනේරු (මධ්‍යම) කාර්යාලය යටතේ වූ ගොඩනැගිලි අංශයේ සිටින කාර්ය මණ්ඩලයෙන් 500 කට අධික සංඛ්‍යාවක් නිසි කාර්ය සැලැසුමක් අනුව සේවයේ යොදා නොගෙන පෞද්ගලික අංශයෙන් ලබා ගත් කම්කරුවන් 20 කට 2015 වර්ෂයේදී රු.මිලියන 1.22 ක් ගෙවීම් කර තිබුණි.

(ඊ) 1987 ජනවාරි 05 දිනැති අංක 887 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ආර්ථික කුලිය අදාළ වර්ෂය වෙනුවෙන් පමණක් අනුමත කරන බව සඳහන් කර තිබුණි. ඊළග වර්ෂය වෙනුවෙන් වූ ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු වුවත්, ඊට පටහැනි අයුරින් ආයතන 04 කට අදාළ රජයේ නිවාස 821 ක් සඳහා වර්ෂ කිහිපයකට පෙර තක්සේරු කරන ලද ආර්ථික කුලියම වර්තමානයේදී අය කර තිබුණි.

(උ) 2010 ඔක්තෝබර් 29 දිනැති අංක 5/2010 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වැටුප් සෘජුවම සේවකයින්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වලට ප්‍රේෂණය කළ යුතුව තිබුණි. දුම්රිය දෙපාර්තමේන්තුවේ කොළඹින් පිට පළාත්වල සේවක කාර්ය මණ්ඩලයේ වැටුප් මුදලින් ගෙවීම් කර තිබුණි. මේ නිසා සරප් කාර්ය මණ්ඩලය හා දුම්රිය ආරක්ෂක අංශ නිලධාරින්ට අතිකාල, ගමන් වියදම්, දුම්රිය මැදිරි වෙන් කිරීම වැනි කාර්යයන් සඳහා 2015 ජනවාරි මාසයේදී පමණක් රු.511,451 ක නිෂ්කාර්ය වියදමක් කර තිබුණි.

(ඌ) දෙපාර්තමේන්තුවට අයත් පරිශ්‍රවල සවිකර තිබූ ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රවලට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසානයට බැංකු ගිණුම්වලින් අයවිය යුතු විදුලි ගාස්තු රු. 224,670 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ දුරකථන කුටි වෙනුවෙන් 2004 ජුනි 30 දිනට රු.2,651,187 ක් අයවීමට තිබුණි. 2004 ජුනි 30 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා අයවිය යුතු මුදල තක්සේරු කර නොතිබුණි. ට්‍රයිටෙල් දුරකථන කුටි සඳහා එම ආයතනයෙන් 2004 දෙසැම්බර් 31 දිනට රු.1,209,910 ක් අයවිය යුතුව තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුදල තක්සේරු කර නොතිබුණි. මේ අනුව හදුනාගත් රු. 3,861,103 ක ආදායම අයකර නොතිබුණු අතර තවදුරටත් හදුනානොගත් ආදායම හදුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) දුම්රිය මැදිරි බදු දීම සඳහා පෞද්ගලික ආයතන දෙකක් සමග දුම්රිය දෙපාර්තමේන්තුව අත්සන් කර තිබූ ගිවිසුම්වල අපැහැදිලිතාවය නිසා එම ආයතනය දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු ගාස්තු නිශ්චය කිරීමට නොහැකි වී තිබුණි. 2016 මාර්තු 29 දිනැති අංක C/SU/බ්ලූ ලයින්/2016 දරන වෙළඳ හා අලෙවි කළමණාකරුගේ ලිපිය අනුව එක් ආයතනයකින් රු.36,658,140 ක් 2014 වර්ෂය දක්වා ලැබිය යුතුව තිබුණි. අනෙක් සමාගමෙන් 2013 පෙබරවාරි 28 දින දක්වා රු.558,970 ක් ලැබිය යුතුව තිබුණි. අදාළ සමාගම්වලින් මුදල් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සමාලොචිත වර්ෂය අවසන් වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ඔ) 2015 දෙසැම්බර් 31 දිනට සුළු අලෙවිහල් 11 කින් අයවිය යුතුව තිබූ රු.1,383,500 ක් 2016 අප්‍රේල් 30 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) දුම්රිය දෙපාර්තමේන්තුව විසින් බාහිර පාර්ශව වෙත කඩකාමර බදු දීමේ දී කඩකාමර 05 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. ගිවිසුම් අත්සන් කර තිබූ කඩ කාමර 08 කට අදාළව 2015 දෙසැම්බර් 31 දිනට රු. 756,025 ක් (එකතු කළ අගය මත බද්ද ඇතුළත්ව) මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.19 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ඇගයීම් කමිටු වාර්තාවේ 05 ඡේදය පරිදි භාණ්ඩ නැව්ගත කිරීමට පෙර පරීක්ෂාවන් අවශ්‍ය බවට සඳහන්ව තිබුණත්, ඇගයීම් කමිටු තීරණය අභිබවා එවැනි පරීක්ෂාවකින් තොරව රු.11,871,726 ක් වූ ප්‍රවේශ පත්‍ර මිලදී ගෙන තිබුණි.

(ආ) මිලදී ගැනීම් අවස්ථා 05 කදී රු.13,799,731 ක් වටිනා ආනයනික භාණ්ඩ ඇණවුම් කළ පිරිවිතරයන්ට අනුව යෝග්‍යතා සහතික ලබා ගැනීමෙන් තොරව භාර ගෙන තිබුණි. අවස්ථා 02 කදී රු. 661,489 ක් වටිනා භාණ්ඩ වෙනුවෙන් භාණ්ඩ ලැබීම් කුවිතාන්සි නිකුත් කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ භාණ්ඩ ලැබීම් පත්‍ර 45 කට අදාළව රු.8,883,224 ක් වටිනා භාණ්ඩ ඌන සැපයුම් තත්ත්වයේද, රු. 550,177 ක් වටිනා භාණ්ඩ අලාභ හානි තත්ත්වයේද, රු. 2,028,905 ක් වටිනා භාණ්ඩ නුසුදුසු තත්ත්වයේද, පැවති අතර 2016 අප්‍රේල් 30 දින වන විටත් ඒ සඳහා නියමිත ප්‍රමිතියෙන් යුත් භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1998 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා නිරවුල් නොවූ රු.35,715,003 ක්වූ ණයවර ලිපිවලට අදාළ භාණ්ඩ 2015 දෙසැම්බර් 31 දින වන විටත් ගබඩාව වෙත ඉදිරිපත් කර නොතිබුණි. එදින වන විට එම භාණ්ඩ සැපයීම සඳහා වර්ෂ 07 ක සිට වර්ෂ 18 ක් දක්වා පරාසයක කාල පමාවක් සිදු කර තිබුණි.

(ඉ) 2011 ජූලි 27 දින රත්මලාන ගබඩා අංශය වෙත ලැබී තිබූ රු. 914,358 ක් වටිනා භාණ්ඩ දෙපාර්තමේන්තු පිරිවිතරයන්ට අනුකූල වී නොතිබුණි. ඒ වෙනුවට නිවැරදි භාණ්ඩ ලබා ගැනීමට 2016 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) 1993 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන විට භාණ්ඩ ආනයනයේදී රේගු ගාස්තු වශයෙන් රු.205,142,308 ක් වැය කර තිබුණි. එම පිරිවැය 2016 අප්‍රේල් 30 දින වන විටත් තොගයට ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. 1993 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවලට අදාළ නිරවුල් නොකළ හිඟහිටි රේගු ගාස්තු ශේෂය රු.89,568,098 ක් වී තිබුණි.

(උ) මුහුණත වටිනාකම රු. 3,314,700 ක් වූ ප්‍රවේශ පත්‍ර තොගයක් වර්ෂ 15 ක පමණ කාලයක සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඌ) රත්මලාන රජයේ නිවාස සම්බන්ධයෙන් ජල මීටර සවි කිරීමට ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය විසින් රු. මිලියන 77 ක ඇස්තමේන්තුවක් ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබූ අතර එම නිවාස සඳහා 2004 ජනවාරි මාසයේ සිට 2015 ජූලි මාසය දක්වා ජල බිල්පත් ගාස්තු ලෙස

රු. මිලියන 72 ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. ජල මීටර සවි නොකිරීම නිසා මෙවැනි තත්ත්වයක් උද්ගත වී තිබුණි.

(එ) දිස්ත්‍රික් ඉංජිනේරු (ඉහළ) විසින් ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාල 07 ක් යටතේ නිශ්චිත ක්‍රමවේදයක් සකස් කිරීමකින් තොරව මාර්ගයේ කළුගල් යොදා තිබුණි. ඒ සඳහා පිළිවෙලින් 2013, 2014 සහ 2015 වර්ෂවලදී කළුගල් මිලදී ගැනීමට පමණක් රු. 43,688,713 ක් වැය කර තිබුණි.

(ඒ) දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් බදු දීම සම්බන්ධයෙන් සක්‍රිය ලිපිගොනු 5,280 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිග ආදායම රු.මිලියන 1,276,985,437 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඔ) දුම්රිය භාණ්ඩ ප්‍රවාහනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ආයතන 12 කින් රු.70,702,827 ක්ද, 2000 වර්ෂයට පෙර සිට 2014 වර්ෂය අවසාන දක්වා ආයතන 22 කින් රු.30,354,368 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අයකරගෙන නොතිබුණි.

(ඕ) භාණ්ඩ මිලදී ගැනීම සඳහා 1980 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ සැපයුම්කරුවන්ට රු.15,969,069 ක අත්තිකාරම් ගෙවා තිබුණි. ඉන් රු.3,907,621 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. එම අත්තිකාරම් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී දුම්රිය දෙපාර්තමේන්තුව විසින් රජයේ මුද්‍රණාලය වෙත ටිකට් පත් 33,000,000 ක් මුද්‍රණය කිරීම සඳහා භාර දී තිබුණි. රජයේ මුද්‍රණාලය විසින් ටිකට්පත් 24,364,500 ක් මුද්‍රණය කර භාර දි තිබුණි. ඉතිරි ටිකට් පත් ප්‍රමාණය වූ ටිකට්පත් 8,635,500 ක් දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති බවට තොරතුරු රජයේ මුද්‍රණාලයේ පවත්වා ගෙන යනු ලබන පොත්පත් මගින් තහවුරු කර ගැනිමට නොහැකි විය.

(ඌ) රජයේ මුද්‍රණාලයේ මුද්‍රණ අංශයෙහි මුද්‍රණය නොකරන කාණ්ඩ 04 කට අයත් ටිකට්පත් 228,000 ක් පැවතුණි. ඒවා නැවත දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.20 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 212 | 92 | 120 | - |
| (ii) | තෘතියික මට්ටම | 2,909 | 2,071 | 838 | - |
| (iii) | ද්විතියික මට්ටම | 8,500 | 5,018 | 3,482 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 8,601 | 8,026 | 575 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 2,107 | - | 2,107 |
| | **එකතුව** | **20,222** | **17,314** | **5,015** | **2,107** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසන් වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 5,015 ක් පැවැතුණි. දෙපාර්තමේන්තුව විසින් එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට කටයුතු නොකර, සේවකයින් 2,107 ක් අනියම් කාර්ය මණ්ඩලය ලෙස විධිමත් අනුමැතියක් ලබා නොගෙන බඳවාගෙන තිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත කළමනාකරණ සේවකයකු අවිධිමත් ලෙස මුදාහැර තිබුණි.

**(ඇ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් ආහාර දෙපාර්තමේන්තුවේ වාප්පු ක්ෂේත්‍ර නිලධාරියකු අවිධිමත් ලෙස ලබා ගෙන තිබුණි.

**(ඈ) විශ්‍රාමිකයන් නැවත සේවයේ යෙදවීම.**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර දෙපාර්තමේන්තු සේවයෙන් විශ්‍රාම ලබා තිබූ පහත නිලධාරීන් නැවත සේවයේ යොදවාගෙන තිබුණි.

| සේවක වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| දුම්රිය එංජින් රියදුරු | 12 |
| දුම්රිය නියාමක | 47 |
| දුම්රිය ස්ථානාධිපති | 40 |
| දුම්රිය අධීක්ෂණ කළමනාකරණ සේවය | 14 |
| මූලික තාක්ෂණික ශිල්පි (පරිපාලන) | 02 |
| කාලගණක ලිපිකරු | 03 |
| ප්‍රවාහන උප දෙපාර්තමේන්තුව | 20 |
| ෂන්ටන් රියදුරු | 12 |
| රියදුරු සහයක | 32 |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 |
| **එකතුව** | **184** |